# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13

### 2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි

### බෞද්ධ දර්ශනය

භාරතීය දාර්ශනික පසුබිම හා බෞද්ධ දර්ශනයේ මූලධර්ම - **BUPH E - 1015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්ණ සංඛ්‍යාව 10 යි. කාලය පැය : 03

---

01 විශ්ව සම්භවය පිළිබඳ වෛදික ජනයා තුළ පැවැති කුතුහලය නාසාදීය සූත්‍රය ඇසුරින් ඉදිරිපත් කරන්න.

02 සාම්ප්‍රදායික බහුදේවවාදී අදහස සමාජ සදාචාරය විෂයෙහි උපයෝගී කරගත් අයුරු ඍත සංකල්පය පදනම් කරගෙන පැහැදිලි කරන්න.

03 "භාරතීය ආගමික චින්තාව කර්ම මාර්ගයෙන් ඥාන මාර්ගයට ප්‍රවේශවීමේ සන්ධිස්ථානය ආරණ්‍යක යුගයෙන් පිළිබිඹු වේ" විමසන්න.

04 බ්‍රාහ්මන් සහ ආත්මන් සංකල්ප ක්‍රමිකව විකාශය වූ අයුරු වේද සාහිත්‍යය ඇසුරෙන් විශද කරන්න.

05 ෂට් ශාස්තෘ දර්ශනය පදනම් කරගෙන ශාස්වත - උච්ඡේද දෘෂ්ටි පැහැදිලි කරන්න.

06 ත්‍රිලක්ෂණය විශ්ව සාධාරණ ධර්මතාවක් ලෙස සැලකීමේ යුක්තිය ගෙනහැර දක්වන්න.

07 සන්තානගත හා සමාජගත ගැටලු විග්‍රහ කිරීමෙහිලා ප්‍රතීත්‍යසමුප්පාද ඉගැන්වීමෙහි අදාළත්වය පැහැදිලි කරන්න.

08 ලෞකික ලෝකෝත්තර සුභසිද්ධිය පිණිස ආර්ය අෂ්ටාංගික මාර්ගය අදාළ කරගත හැකි අයුරු මූලාශ්‍රයානුසාරයෙන් විග්‍රහ කරන්න.

09 කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙන් පුද්ගල ස්වච්ඡන්දතාව හෝ ශක්‍යතාව නිශේධනය නොවන බව තහවුරු කරන්න.

10 පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකකට පමණක් ප්‍රමාණවත් සටහන් ලියන්න.

I ඉස්සරනිම්මාණවාදය

ii අහෙතුඅප්පච්චයවාදය

iii ඛන්ධ, ආයතන, ධාතු විභාගය

iv "චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි"

***************************************